323

RARE

# මහාචාර්ය සරච්චන්ද්‍රගේ නාට්‍ය නිර්මාණ සඳහා ගැමි නාටක ආභාසය

සද්ධා උත්පල කත්දගේ

ලියාපදිංචි අංකය :- මාශාපි/දප/95/06

| ප්‍රවේශ අංකය | 323 |
| --- | --- |
| වර්ග අංකය | |

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ

දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2001 අගෝස්තු

# සාරාංශය

මහාචාර්ය සරච්චන්ද්‍රගේ නාට්‍ය නිර්මාණ ලාංකික ප්‍රේක්ෂක සමාජයට ඉදිරිපත් වූ දින සිටම විමර්ශණයට බඳුන් වූ බවක් නොපෙනෙයි. නාට්‍යකරුවෙකු වශයෙන් ඔහු පිළිබඳ විශේෂ අවධානය යොමු වූයේ මනමේ නාටකයේ නිෂ්පාදකවරයා ලෙස සරච්චන්ද්‍ර හඳුනා ගැනීමත් සමගය. ඉන් අනතුරුව ඔහු සහ ඔහුගේ නිර්මාණ පිළිබඳව පුවත්පත් ලිපි, සඟරා ලිපි, විචාර ග්‍රන්ථ ආදී වශයෙන් විවිධාකාරයේ කෘති බිහිවන්නට විය. බොහෝ විට සරච්චන්ද්‍ර නාට්‍ය නිර්මාණයන්ගේ එකම පැතිකඩක් අරභයා විවිධ ලේඛකයෝ එකම දේ ලියූහ. ඇතැම් විචාර පක්ෂග්‍රාහී වූවා පමණක් නො ව කිසිදු විචාරාත්මක බවකින් ද යුතු නො වීය. මේ විචාර කළේ ඔහුගේ සිසු පිරිස් වීම මීට එක් හේතුවක් බව පැහැදිලිය.

සරච්චන්ද්‍ර නාට්‍ය නිර්මාණයන්හි ඇතුළත් සංගීතය පිළිබඳව හෝ එවැනි වෙනත් එක් අංගයක් පිළිබඳව හෝ උනන්දුවක් දක්වූ ඇතැම් පර්යේෂකයෝ එම නාට්‍යයේම ඇති නර්තන රචනය, රංග වස්ත්‍ර, පසුතල, රංග උපක්‍රම ආදී වූ අනෙකුත් අනුශාංගික කලාවක් පිළිබඳව තම අවධානය යොමු නොකළහ. සරච්චන්ද්‍ර සිංහල වේදිකාවට කළ නිර්මාණයන්හි ඇතුළත් දේශීය ලක්ෂණ හඳුනා ගැනීමට මෙතෙක් කිසිදු පර්යේෂකයෙකු උත්සාහ කර නොතිබිණි. මේ පිළිබඳව ප්‍රාමාණික පර්යේෂණයක් සිදුකර නොමැති බැවින් මෙම විෂය අළලා පර්යේෂණයක් කිරීමට මම අදහස් කළෙමි. මෙම පර්යේෂණය සඳහා දිවයිනේ නොයෙකුත් පළාත්වල පවත්වන ලද ගැමි නාටක, ශාන්තිකර්ම හා සරච්චන්ද්‍ර නාට්‍ය නිර්මාණ විශාල සංඛ්‍යාවක් සඳහා පෞද්ගලිකව ම සහභාගී විය. ඒවා නිරීක්ෂණය ඒ මගින් සරච්චන්ද්‍ර සිය නාට්‍ය

නිර්මාණ සඳහා ගැමි නාටකයෙන් ලැබූ ආභාසය පිළිබඳ නිවැරැදි විග්‍රහයක් කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය විය.

ඒ අනුව මේ නිබන්ධයේ පළමු පරිච්ඡේදයෙන් සිංහල නාට්‍ය කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳව හැඳින්වීමක් කරන ලදී. දෙවැනි පරිච්ඡේදය මගින් සොකරි, කෝලම් හා නාඩගම් යන ජන නාටක ත්‍රිත්වයේ ප්‍රභවයට අදාළ මත විමසුමට ලක් කරමින් ඒවායේ ඇතුළත් සාවද්‍ය තොරතුරු නිරවද්‍ය කිරීමට උත්සාහ ගතිමි. එසේම එම ජන නාටකයන් ඇතැම් ප්‍රදේශයක ප්‍රචලිත වීමටත්, ඇතැම් ප්‍රදේශයක ප්‍රචලිත නො වීමටත් පලපෑ සාධක විමසා බලන ලදී. එක් එක් ගැමි නාටකයේ ප්‍රාදේශීය වෙනස්කම් පිළිබඳ අවධානය යොමු කරන ලද්දේ ද දෙවැනි පරිච්ඡේදයේ දී ම ය. පසු කාලීනව ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වූ නෘත්‍ය පිළිබඳව සහ මහාචාර්ය සරච්චන්ද්‍ර සිංහල නාට්‍ය ක්ෂේත්‍රයට නව සම්ප්‍රදායක් හඳුන්වා දීම පිළිබඳව තුන්වැනි පරිච්ඡේදයේ දී විමසා බලන ලදී. එසේම සරච්චන්ද්‍ර හඳුන්වා දුන් නාට්‍ය ශෛලියේ විශේෂතා පිළිබව ද එහිදී කරුණු දක්වන ලදී.

ගැමි නාටක සම්ප්‍රදායන්ගේ ඇතුළත් නර්තනය, සංගීතය, වෙස් ගැන්වීම්, අංග රචනය සහ රංග උපක්‍රම ආදී වූ ශිල්ප ක්‍රම හඳුන්වා දෙමින් සරච්චන්ද්‍ර සිය නාට්‍ය නිර්මාණ සඳහා ගැමි නාටකයේ එකී ශිල්ප ක්‍රමවල අභාසය ලබා ඇති අයුරු විමර්ශනාත්මකව විග්‍රහ කිරීමට හතරවැනි පරිච්ඡේදයේ දී උත්සාහ ගන්නා ලදී.

මහාචාර්ය සරච්චන්ද්‍ර නාට්‍ය ප්‍රබන්ධකරණයේ දී ගැමි නාටකයෙන් ලැබූ ආභාසය මේ දක්වා කිසිවෙකුගේ විශේෂ අවධානයට යොමු

නො වූ විෂයයකි. එබැවින් නාට්‍ය රචනයේ දී බලපැවැත්වෙන චරිත නිරූපණය, අවස්ථා සහ සිද්ධි නිර්මාණය, තේමාව හා පරමාර්ථ, රචනා ආකෘතිය වැනි අංග හා ගැමි නාටකයේ එම අංග පිළිබඳව පස්වැනි පරිච්ඡේදයෙන් අප විමර්ශනයට හසු වෙයි.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

මේ සියලු දත්තයන් සමාලෝචනයේ දී හෙළි කර ගත හැකි වූ කරුණු කීපයකි. සරච්චන්ද්‍ර සිය නාට්‍ය නිර්මාණ සඳහා දේශීය ජන නාටක හා ශාන්තිකර්මයන්හි ඇතුළත් අංග නවීකරණය කරමින් නාට්‍යෝචිතව සකසා ගෙන ඇති බව අනාවරණය කළ හැකි විය. සරච්චන්ද්‍ර සිංහල නාට්‍ය ක්ෂේත්‍රයට එක් කළ නව සම්ප්‍රදාය ඔහුට ආවේණික වූවක් මිස දේශීය නාට්‍ය සම්ප්‍රදායේ මහා සම්ප්‍රදාය ලෙස හැඳින්වීම යුක්ති යුක්ත නො වන බව සාධක සහිතව පැහැදිලි කිරීමට අවකාශ සැලසිණි. කෙසේ වෙතත් සරච්චන්ද්‍රගේ නව නාට්‍ය ශෛලිය මගින් පැරණි ගැමි නාටක සංරක්ෂණය සඳහා වක්‍රාකාර බලපෑමක් ඇති වූ අයුරු මෙම අධ්‍යයනයෙහි ලා පෙන්වා දෙන ලදී.

මෙම පර්යේෂණ නිබන්ධය සම්පාදනය කිරීමේ දී අප විසින් විධි ක්‍රමයක් ද්වයයක් අනුගමනය කරන ලදී. ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය කිරීම මගින් දත්ත රැස් කර ගැනීම එයින් එක් ක්‍රමයක් වන අතර ක්ෂෙත්‍ර අධ්‍යයනය හා ප්‍රත්‍යොයක අධ්‍යයනය අනෙක් විධි ක්‍රමය විය.

මහාචාර්ය සරච්චන්ද්‍ර නාට්‍ය නිර්මාණකරණයට පිවිසියේ 1940 දශකයේ වුව ද ඔහුගේ මුල් කාලීන නිර්මාණ පිළිබඳව විචාරකයින්ගේ අවධානය යොමු වූ බවක් නො පෙනෙයි. 1950 දශකය තුළ මනමේ නාටකය නිර්මාණය කිරීමත් සමගම සරච්චන්ද්‍ර නමැති නාට්‍යකරුවා සහ ඔහුගේ

නිර්මාණ පිළිබඳව විචාර, විවේචන හා ඇගයීම් ආදී වශයෙන් සාහිත්‍යයක් ගොඩනැගෙන්නට විය. එකී මූලාශ්‍රය මෙවැනි අධ්‍යයනයකදී යොදා ගැනීම ප්‍රයෝජනවත් වන්නකි. එමගින් විෂයානුබද්ධ තොරතුරු එක්රැස් කර විග්‍රහයක යෙදීමට හැකියාව ලැබුණි.

දිවයිනේ විවිධ පළාත්වල ශිල්පීන් විසින් වරින් වර පවත්වන ලද ජන නාටක හා ශාන්තිකර්ම නරඹා කරුණු එක්රැස් කිරීම හා විවිධ සම්පත් පුද්ගලයන් සමග කළ සම්මුඛ සාකච්ඡා මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර අධ්‍යයනය හා ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය වශයෙන් යොදා ගන්නට විය. ජන නාටක හා සරච්චන්ද්‍ර නිර්මාණ නැරඹූ සාමාන්‍ය ප්‍රේක්ෂකයන් සමග නිර්ආකෘතික වූ සාකච්ඡා පැවැත්වීම ඇතැම් කරුණු විග්‍රහ කිරීමේ මග පහසු කරන්නක් විය. ජන නාටක පටිගත කර ගැනීම හා සටහන් කර ගැනීමත්, අත්පිටපත් අධ්‍යයනය කිරීමත්, මෙහිදී කරන ලදී. ජන නාටක සම්ප්‍රදායන්ගේ හා සරච්චන්ද්‍ර නිර්මාණයන්හි විවිධ ජවනිකා ඡායාරූපගත කර ගැනීමත් මෙවැනි අධ්‍යයනයක දී වැදගත් වූ බව කිව යුතු ය. (මූලාශ්‍රය හැඳින්වීම යටතේ මේ පිළිබඳව ප්‍රාමාණික තොරතුරු ඇතුළත් කොට ඇත.)